›

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2478/41 - 2026 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2026.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 5/2025

**2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

1 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන නියමය

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බලශක්ති අමාත්‍ය පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි වන මා විසින්-

(අ) ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් මූලික පැවරීමේ සැලැස්ම 2026 ජනවාරි මස 5 වන දින සකස් කර ඇති බවට;

(ආ) බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ඇතුළත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය 2026 මාර්තු මස 3 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට; සහ

(ඇ) වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්ම, දීර්ඝකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම සහ දීර්ඝකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2026 පෙබරවාරි මස 18 වන දින සකස් කර ඇති බවට,

සෑහීමට පත්වීමෙන් පසුව, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන හැර, ඉහත කී පනතේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු දිනය ලෙස 2026 මාර්තු මස 09 වන දිනය නියම කරනු ලැබේ

**උපලේඛනය**

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අනුව, 1 වන වගන්තිය, 2 වන වගන්තිය, 3 වන වගන්තිය, 4 වන වගන්තිය, 5 වන වගන්තිය, 9 වන වගන්තිය, 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය, 10 වන වගන්තියේ (3) වන උපවගන්තිය, 10 වන වගන්තියේ (5) වන උපවගන්තිය, 14 වන වගන්තිය, 15 වන වගන්තිය, 17 වන වගන්තිය, 18 වන වගන්තිය, 38 වන වගන්තිය සහ 39 වන වගන්තිය 2024 ජූනි මස 27 වන දින සිට ක්‍රියාත්මක වේ.

**පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි,**
බලශක්ති අමාත්‍ය.

2026 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 - 0055

1A - G 46407 — 04 (2026/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*